- වල් පැළ ගහනය සඳහන් කරන්න. රූප සටහනේ ස්වාභාවික පාට යොදන්න. උදා. නීරෝගී ශාක කොටස් සඳහා කොළ පැහැය සහ රෝග ශාක සහ ශාක කොටස් කහ පැහැය.
- පළිබෝධ හා හිතකර කෘමීන් ශාකයේ නිරීක්ෂණය කළ ස්ථානයේම රූප සටහනේ සටහන් කරන්න.
- පළිබෝධ කෘමීන් හා වල් පැළ සඳහා සාමාන්‍යයෙන් හඳුන්වන නාම සටහන් කරන්න.
- එම අවස්ථාවේ පවතින කාලගුණ තත්ත්වය සඳහන් කරන්න.
- රූප සටහනේ දිනය හා ස්ථානය සඳහන් කරන්න.




12. රූප සටහන් ආශ්‍රයෙන් ගොවීහු ඉදිරිපත් කිරීම් (presentations) කරති. එම රූප සටහන් සාකච්ඡාවට භාජනය වේ. ඒ ඇසුරෙන් ඉදිරි සතිය තුළ බෝගය සඳහා කළ යුතු ක්‍රියාකාරකම් සාමුහික ව තීරණය කරති.

13. ව්‍යාප්ති නිලධාරියා විෂයමාලාවට අනුකූල වෙමින්, එම අවස්ථාවේ බෝගය පවතින වර්ධක අවස්ථාවට ගැලපෙන මාතෘකාවක් යටතේ ගොවීන් දැනුවත් කරයි.

14. මෙම ගොවි ක්ෂේත්‍ර පාසල් මුං, රටකජු, ලූණු, මිරිස් ආදී බෝග සඳහා දියත් වූ අතර ඉදිරි කන්නවලදී උඳු, එළවළු හා වෙනත් ක්ෂේත්‍ර බෝග ඇතුළත් කිරීමට අපේක්ෂා කෙරේ.

15. ගොවි ක්ෂේත්‍ර පාසල් ආරම්භ කිරීමට පෙර කෘෂි ව්‍යාපෘති නිලධාරීන් වෙනුවෙන් 'පුහුණුකරුවන් සඳහා පැවැත්වෙන පුහුණු කිරීමේ වැඩමුළු' (Training of Trainers) පවත්වා ඇත.

16. මෙම වැඩමුළු මගින් දේශගුණ සුහුරු කෘෂිකර්මය (Climates Smart Agriculture) සහ ගොවි ක්ෂේත්‍ර පාසල් සංකල්පය, එය ක්‍රියාත්මක කෙරෙන ආකාරය පිළිබඳ දැනුම හා ප්‍රායෝගික භාවිතාවත් යාවත්කාලීන කරන ලදී.

**නිර්මාණය හා සැකසුම:**
**මහාචාර්ය මහින්ද විජේරත්න,**
**කෘෂි ව්‍යාප්ති (FFS) විශේෂඥ,**
**කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය**

**2024 ඔක්තෝබර් 11**



1/2/2, කන්දවත්ත පාර, පැලවත්ත, බත්තරමුල්ල
011-2770986/0112760998
info@sarp.lk
www.sarp.lk

**කෘෂිකර්ම අමාත්‍යාංශය**

## කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සඳහා වන අහිතකර බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය [1]

# ගොවි ක්ෂේත්‍ර පාසල

# Farmer Field School (FFS)



**ව්‍යාපෘතියේ අරමුණු**

- **තෝරා ගන්නා ලද දිස්ත්‍රික්ක වල කුඩා පරිමාණ ගොවි පවුල් 40,000 (පුද්ගලයින් 180,000) කගේ ජීවන තත්ත්වය ඉහළ දැමීම සඳහා කෘෂි ඵලදායීතාවය ඉහළ දැමීම, ගොවීන් ව්‍යවසායකයන් බවට පත් කිරීම, වෙළඳපොළ ග්‍රහණය කිරීම, අහිතකර දේශගුණ සාධක යටතේ බෝග වගාව වැනි අරමුණු සහිතව SARP හි වැඩසටහන් ක්‍රියාත්මක වේ.**
- **දැදුරු ඔය, මල්වතු ඔය, මී ඔය යන ගංගා ද්‍රෝණියන්හි එල්ලංගා පද්ධතීන් වෙතින් පෝෂණය වන වියළි කලාපීය අහිතකර පාරිසරික තත්ත්ව යටතේ කුරුණෑගල, පුත්තලම, මාතලේ, අනුරාධපුර, වවුනියාව සහ මන්නාරම් යන දිස්ත්‍රික්කයන්හි ඉලක්කගත ග්‍රාමසේවා වසම් 100ක ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.**

[1] කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත්, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IAFD) මෙම ව්‍යාපෘතිය සඳහා දායකත්වය සපයයි.

## ගොවි ක්ෂේත්‍ර පාසල (FFS) හි මූලධර්ම හා ක්‍රියාත්මක කිරීම පහත දැක්වෙන පරිදි සංක්ෂිප්තව ඉදිරිපත් කළ හැකිය.

1. SARP මගින් ක්‍රියාත්මක කෙරෙන විවිධ වූ ක්‍රියාකාරකම් අතර ගොවි ක්ෂේත්‍ර පාසල යන සංකල්පය මත පදනම් වූ කෘෂි ව්‍යාප්ති වැඩසටහන ඉලක්කගත දිස්ත්‍රික්කවල 2024 යල කන්නයේ සිට ආරම්භ කර ඇත.

2. කෘෂි සංවර්ධනයේ දී කෘෂි ව්‍යාප්තිය අත්‍යාවශ්‍ය සාධකයක් වන අතර ගොවි ක්ෂේත්‍ර පාසල (Farmer Field School) යනු ඒ සඳහා යොදා ගන්නා කෘෂි ව්‍යාප්ති ක්‍රමවේදයකි. එහි මූලධර්මය පහත දැක්වේ.




3. මෙම ක්‍රමය විසින් ගොවීන් පර්යේෂණාත්මකව ඉගෙනීමකට (Experimental Learning) යොමු කරනු ලබයි. ගොවීහු සක්‍රීයව සහභාගී වෙමින්, ක්ෂේත්‍ර ක්‍රියාකාරකම්වල යෙදෙමින් ඉගෙන ගනිති (Learning by doing). නව දැනුම හා තාක්ෂණය ගොවීන් වෙත සම්ප්‍රේෂණය කෙරෙයි.

4. එක් යායක හෝ එක් ගමක එකම බෝගය වගා කරන ගොවීන් 25ත් 30ත් අතර කණ්ඩායමක් එක් ගොවි ක්ෂේත්‍ර පාසලකට සහභාගී වෙයි.

5. කන්නයේ සෑම සතියකම (සති 10ක් පමණ) නිශ්චිත දිනයක, නිශ්චිත වෙලාවක, නිශ්චිත ස්ථානයක දී එම ගොවි කණ්ඩායම ව්‍යාපෘති නිලධාරියා සමග හමුවෙයි.




**ගොවි ක්ෂේත්‍ර පාසලක ක්‍රියාත්මක දින සැකසුම**

06. ගොවි ක්ෂේත්‍ර පාසලක ප්‍රධාන සංරචක පහත සඳහන් වේ.




6. ගොවි ක්ෂේත්‍ර පාසල සඳහා ආදර්ශ ගොවිබිමක් පවත්වා ගත යුතුය.
7. ගොවි ක්ෂේත්‍ර පාසල පවත්වන දිනවල ගොවි කණ්ඩායම උප කණ්ඩායම්වලට බෙදී ක්ෂේත්‍ර නිරීක්ෂණය සඳහා යොමු වේ. මෙහි දී කෘෂි පරිසර පද්ධති විශ්ලේෂණය (Agro eco-system analysis - AESA) සඳහා අවශ්‍ය වන දත්ත එක්රැස් කරයි.
8. කෘෂි පරිසර පද්ධති විශ්ලේෂණයේ දී එම අවස්ථාවේ ක්ෂේත්‍රයේ පවතින බෝග/සත්ත්ව හා ජීවී/අජීවී කොටස් අතර ඇති අන්තර් සම්බන්ධතා නිරීක්ෂණය කර සටහන් කර ගනී. මෙය, ක්ෂේත්‍ර තත්ත්ව විශ්ලේෂණය කිරීම සඳහා ගොවීන්ට සහ ක්ෂේත්‍ර නිලධාරීන්ට අනුගමනය කළ හැකි ක්‍රියාවලියකි.
9. ක්ෂේත්‍ර නිරීක්ෂණය - ක්ෂේත්‍රයේ නියරේ සිට අඩි 5ක් (මීටර 2ක්) ඇතුළතින් වර්ග මීටරයක පමණ ප්‍රමාණයක් නිරීක්ෂණය කරන්න.

**පහත සඳහන් නිරීක්ෂණ සටහන් කරන්න.**

- හමුවන කෘමීන් (පළිබෝධ හා හිතකර කෘමීන්)
- ශාකයේ සිටින පළිබෝධ හා හිතකර කෘමීන්
- පසෙහි සිටින ජීවීන්, පළිබෝධ හා හිතකර කෘමීන්
- රෝග හා ඒවායේ තීව්‍රතාවන්
- රෝග ආසාදනය වූ කොටසේ ප්‍රතිශතයක් ලෙස
- ශාකයේ උස, පත්‍ර සංඛ්‍යාව, ප්‍රජනන කොටස්, මෙම දත්ත වර්ධන අවධියේ ඊළඟ සතිය සඳහා තීරණ ගැනීම සඳහා වැදගත් වේ.
- වල් වර්ග, ගහනය, වර්ධන අවධිය, බෝගය සමග ඇති සම්බන්ධතාව.
- පාංශු තත්ත්ව, ජල සැපයුම
- පාරිසරික තත්ත්ව, සූර්යාලෝකය, වළාකුළු සහිත වැසිබර සුළඟ, සෙවන ආදීය

10. රූප සටහන් නිර්මාණය - මේ සඳහා බ්‍රිස්ටල් බෝඩ්, ඩිමයි කොළ යොදා ගන්න.
    - රූප සටහනේ මැද ශාකය නිරූපණය කරන්න.
    - පළිබෝධ කෘමීන් එක පැත්තකත් (වම), හිතකර කෘමීන් එක පැත්තකත් (දකුණ) සටහන් කරන්න.
    - පාංශු තත්ත්ව සටහන් කරන්න.